කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

නීති පීඨය

නීතිවේදී උපාධි පරීක්ෂණය - සිව්වන වසර - 2017/2018

# පරිසර නීතිය

පැ තුනයි (03)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව - 07

ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.
(අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කෙරේ.)

---

01. (අ) ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීමෙහි ලා චිරස්ථායී සංවර්ධනය පිළිබඳ සංකල්පයෙහි වැදගත්කම කෙතරම් දුරට ශ්‍රී ලංකාවේ අධිකරණය හඳුනාගෙන ඇත්දැයි පැහැදිලි කරන්න.

(ආ) පූර්ව නිදර්ශන න්‍යාය (Precautionary Principle) ශ්‍රී ලංකාවේ පරිසර ක්ෂේත්‍රයේ ව්‍යවස්ථාවන් තුළ සහ අධිකරණ තීන්දු තුළ කෙතරම් දුරට අන්තර්ග්‍රහණය කර ඇත්දැයි පැහැදිලි කරන්න.

2. ජාතික පාරිසරික පනතේ දීර්ඝ නාමය දක්වන පරිදි

"මෙම පනත ... පරිසරය ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම උදෙසා මෙන්ම ඊට අනුෂාංගික වූ කරුණු වෙනුවෙන් විධිවිධාන සම්පාදනයට ..."

ශ්‍රී ලංකාවේ පරිසරය ආරක්ෂා කිරීමට සහ කළමනාකරණය කිරීමට ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන ජාතික පාරිසරික පනතේ ඇත්දැයි එම පනතේ ප්‍රතිපාදන ඇසුරින් සාකච්ඡා කරන්න.

අ.පි.බ.

3. (අ) මහජන කරදරය පිළිබඳ නඩුකර යනු, මහජනතාවට අප්‍රසන්නකමක්, අපහසුතාවක්, හෝ අවහිරතාවකින් තොරවූ ආරක්ෂිත පරිසරයක් තහවුරු කරන්නා වූ අපරාධමය වරදකි. පාරිසරික නීති විකාශනයේ දී මහජන කරදරය සුවිශේෂී කාර්යභාරයක් සිදුකරන ලදී. පරිසර නීතියේ වර්ධනය පිළිබඳ මුල් කාලයේ දී මහජන කරදරය වාතය, ජලය සහ පස මෙන්ම අනෙකුත් ස්වභාවික සම්පත් ආරක්ෂා කරන ලදී.

ඉහත ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

(ආ) ඇතැම් අවස්ථාවලදී, මහජන කරදරය පිළිබඳ නඩුකර කර්මාන්තයන් හි ක්‍රියාකාරීත්වයට අභියෝග එල්ල කරයි. චිරස්ථායී සංවර්ධනය මුදුන්පත් කර ගැනීමට නම් කර්මාන්තශාලා හිමිකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රතිතර්ක ප්‍රවේශමෙන් සලකා බැලිය යුතුය. සංවර්ධනය වෙමින් පවතින රටවල් පිළිබඳ සංදර්භයේ දී මෙය සුවිශේෂී ලෙස අදාළ වේ.

4. "මානවයා ආරක්ෂා කිරීම කේන්ද්‍රීය සාධකය වූ දැනට පවතින මානව හිමිකම් සහ පරිසරය පිළිබඳ රාමුව තුළ අප තවදුරටත් සිතිය යුතුද ජීවත් වීමේ අයිතිය, පෞද්ගලික ජීවිතය සහ දේපලට ඇති අයිතිය වැනි අයිතිවාසිකම් අත්‍යන්තයෙන්ම හරිත කරන්නා වූ, එසේත් නොමැති නම්, ඍජුවම පාරිසරික අයිතීන් පිළිබඳ කතිකාවකට කාලය එළඹ ඇත්ද; වෙනත් ලෙසකින් කිවහොත් පරිසරය ආරක්ෂා කිරීම උදෙසාම ඊටම අනන්‍ය වූ හිමිකමක් පැවතිය යුතුද, අප මානව කේන්ද්‍රීයභාවයෙන් පරිසර කේන්ද්‍රීයභාවයට විතැන් විය යුතුද? Boyle A. (2012), "Human Rights and the Environment, Where Next", *European Journal of international Law*, Volume 23, Issue 3 , pp.613-642

ඉහත ප්‍රකාශය පිළිබඳ ඔබගේ මතය ලියා දක්වන්න.

අ.පි.බ.

5. ශ්‍රී ලංකාවේ පරිසර ඇගයීම් තක්සේරු වාර්තාව (EIA) පිළිබඳ කාර්ය පටිපාටියෙහි බොහෝ පැතිකඩ තව දුරටත් වර්ධනය සඳහා ඉඩ හසර පවතී. දැනට පවත්වන පරිසර තක්සේරු වාර්තා නීති ක්‍රමය තුළ පවතින දුර්වලතා හඳුනාගෙන එය කාර්යක්ෂම කිරීමට සිදුකළ හැකි නිර්දේශ සාකච්ඡා කරන්න.

ඔබේ සාකච්ඡාව තුළ පාරිසරික තත්ත්වයන් වාර්තාව මගින් ශ්‍රී ලංකාව තුළ යහ පාලනය සහ ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම ප්‍රවර්ධනය කරන්නේ කෙසේද යන්න පිළිබිඹු විය යුතුය.

6. ඔබේ මනාපය පරිදි ඕනෑම රටවල් තුනක් තෝරාගෙන ඒවායේ පරිසරය ආරක්ෂා කිරීමට ධූලක තෝරන නඩුකර කෙතරම් දුරට ඉවහල් වී තිබේද යන්න සාකච්ඡා කරන්න.

7. (අ) අන්තර්ජාතික ප්‍රකාශනයන් (International Declarations) මෘදු නීතීන් (Soft Laws) ලෙස සළකන අතර ඒවා රාජ්‍යයන් බඳවා නොතබයි. කෙසේ වුවත් පාරිසරික නීති ක්ෂේත්‍රය තුළ අන්තර්ජාතික ප්‍රකාශනයන් පරිසරය ආරක්ෂා කිරීම උදෙසා වූ අධිකරණ තීන්දු ලබාදීමේදී අධිකරණයට බලපෑම් කර තිබේ.

ශ්‍රී ලංකාවේ අත්දැකීම් ඇසුරින් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

(ආ) තෙත්බිම් ආරක්ෂා කිරීමට ක්‍රියාකිරීම කැප වූ අන්තර්ජාතික සංවිධානයක් තෙත්බිම් ආරක්ෂා කිරීම පිළිබඳ සම්මන්ත්‍රණයක් සංවිධානය කර ඇත. ඒ සඳහා "ශ්‍රී ලංකා නීති පර්ෂදය තුළ දිය ඇලි සංරක්ෂණ පරිසර කලාප (Waterfowl Habitat) වැනි අන්තර්ජාතික තෙත් බිම් පිළිබඳ සම්මුතීන්හි අන්තර්ජාතික වශයෙන් සුවිශේෂී වන මූලධර්ම" යන මැයෙන් දේශනයක් කිරීමට එම සංවිධානය ඔබෙන් ඉල්ලා සිටී. ඔබේ ඉදිරිපත් කිරීමේ අන්තර්ගත වන වැදගත් කරුණු පැහැදිලි කරන්න.

○॰○॰○॰○॰○॰○॰○॰○॰